**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 07 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 17 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 27 වැනි දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **<u>මතය</u>**

මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම.</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන කොන්ක්‍රීට් කුට්ටිගල් නිෂ්පාදිත ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය අවසානයට වූ නිෂ්පාදනය කරන ලද කොන්ක්‍රීට් කුට්ටි ගල් 14,627 ක අවසාන තොගයේ වටිනාකම ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉහත ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලද ඉතිරි අමු ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.107,975 ක් වූ අතර එම ප්‍රමාණය ඉතිරි තොග වශයෙන් ගිණුම් ගත නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ගම නැගුම ව්‍යාපෘතිය යටතේ සියඹලාණ්ඩුව ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 70361364 දරන ඉතිරි කිරීමේ ගිණුමෙහි සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු.779,095 ක් වුවද එය රු.708,104 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් රු.70,991 ක් අඩුවෙන් සටහන් වී තිබුණි.

1.3.3 **<u>නොසැසඳු පාලන ගිණුම්</u>**

ගිණුම් විෂයන් 08 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ අනුව ශේෂයන්ගේ එකතුව රු.15,027,500 ක් වූ අතර, උපයෝගි ලේඛන අනුව ශේෂය රු.9,393,815ක් විය.

1.3.4 **<u>ලැබිය යුතු ගිණුම්</u>**

සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 8 දෙනෙකුට ලබා දී ඇති සේවක ණය වලින් රු.37,299 ක් දීර්ඝ කාලයක සිට අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,623,248 ක් වූ වත්කම් විෂයන් 03 ක් හා රු.24,676,721 ක් වූ වගකීම් විෂයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| (i). 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.26,181,723 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii). 136 වගන්තිය | සභාව සතු කඩ කාමර සඳහා කුලී, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,689,691 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,166,375 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **බදුකුලී**

සභාව සතු කඩ කාමර 80 ක කුලී ගිවිසුම්වල කාල සීමාව ඉක්මවා ගොස් තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ඇතිමලේ කඩ කාමර 05 ක් බදුකරුවන් වෙත ලබා දී තිබුණද කඩ කාමර කුලී ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවුණි.

2.2.2 **වෙනත් ආදායම්**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන සහ 1968 අංක 14 දරන ලංකා සංචාරක සංවර්ධන පනතේ කාර්යයක් සඳහා ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය අනුමත කර ඇති හෝටල්/ ලැගුම්හල්වලින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් 1% එක නොඉක්මවන ගාස්තුවක් අතුරු ව්‍යවස්ථා පනවා පළාත් පාලන ආයතන විසින් අයකර ගත යුතු වුවද ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ලැගුම්හලකින් එසේ ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනිකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,029,500 |
| මුද්දර ගාස්තු | 2,319,560 |

2.2.4 **අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු.759,593 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) 2013 මැයි 17 දින සමනල බැද්ද සමෘද්ධි සමිතිය වෙත ගිවිසුම් ගත බැඳීමකින් තොරව රු.82,500 ක් වටිනා කොන්ක්‍රීට් කුට්ටි ගල් 3000ක් ණය පදනම මත නිකුත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස සභාව කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු.268,725 ක් වියදම් දරා තිබූ අතර වීථි පහන් ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය , සවි කළ යුතු පහන් වර්ගය, සංඛ්‍යාව යනාදි තොරතුරු වාර්තාගත කර නොතිබුණි.

4. **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මගින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය